ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජනවාරි 2014

## (52) ආර්ථික විද්‍යාව
(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට අයදුම්කරුවන් පිළිතුරු දී තිබූ ආකාරය සමස්ථයක් වශයෙන් බලන විට සතුටුදායක මට්ටමක් පෙන්නුම් කර තිබුණි. එහෙත් සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් පිළිතුරු ඉදිරිපත් කිරීමේදී තරමක පසුබෑමක් දක්නට ලැබුණි. එසේ වීමට හේතු වශයෙන් උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයට ලක්වූ ඇතැම් දුර්වලතා පහත දැක්වේ.

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු** 40 (ලකුණු 02 බැගින් බහුවරණ ප්‍රශ්න 20)
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය සකස් කර ඇත්තේ සමස්ථ විෂය නිර්දේශය හා ආර්ථික විද්‍යාවට සම්බන්ධ ප්‍රායෝගික දැනුම ආවරණය වන ආකාරයට වේ. අයදුම්කරුවන්ගෙන් කිහිප දෙනෙකු පමණක් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි. එසේම අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සමත්වීමේ භාග්‍යය උදාකර ගෙන තිබුණේ මෙම ප්‍රශ්න සඳහා වැඩි ලකුණු ලබා ගැනීම නිසයි. එහෙත් මෙම ප්‍රශ්න 20 සඳහා පිළිතුරු සැපයීමේ හැකියාව කුමන මට්ටමක පැවතියේ ද යන්න මැනීමට අයදුම්කරුවන්ගෙන් නියැදියක් අහඹු ලෙස තෝරා ගෙන නිරීක්ෂණය කිරීමේදී ප්‍රශ්න අංක (A), (E), (I), (K), සහ (P) යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් බව දක්නට ලැබුණි. ඒ අනුව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට නිරීක්ෂණය වූ පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය.

<u>(A) ප්‍රශ්නය සඳහා</u>

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පිළිබඳ මූලික අවබෝධයක් නොමැති බව සහ විශේෂයෙන් වැඩෙන ආවස්ථික පිරිවැය පිළිබඳව දැනුම අල්ප බව දක්නට ලැබුණි.

<u>(E) ප්‍රශ්නය සඳහා</u>

සැපයුම් නම්‍යතාවය තීරණය කරන සාධක ප්‍රශ්නයේ ඉතා පැහැදිලිව දක්වා තිබුණද ඒවා නිසිපරිදි ගොනුකර දැක්වීමේ නොහැකියාව දක්නට ලැබුණි. බහුතරයක් පිළිතුරු වශයෙන් (2) වරණය යෙදීම එයට උදාහරණ වේ.

<u>(I) ප්‍රශ්නය සඳහා</u>

උපරිම මිලක් පැනවීම සම්බන්ධයෙන් වෙළෙඳපොලක න්‍යායාත්මක ප්‍රතිවිපාක පිළිබඳව දැනුම අල්ප නිසා නිවැරදි වරණය තෝරා ගැනීමට අපොහොසත් වී ඇත.

<u>(K) ප්‍රශ්නය සඳහා</u>

ජාතික ගිණුම්වල දක්නට ලැබෙන විදීම් හා කාන්දුවීම් වැනි සරල ගැටළුවක් පවා නිරාකරණය කිරීමට අයදුම්කරුවන් වැඩි දෙනෙක් අපොහොසත් වී තිබුණි.

<u>(P) ප්‍රශ්නය සඳහා</u>

දත්ත ඇසුරින් පටු මුදල් සැපයුම ගණනය කිරීමේ හැකියාව මැනීම මෙයින් අපේක්ෂිතයි. එහෙත් පටු මුදල් සංකල්පය පිළිබඳව පැහැදිලි දැනුමක් නොතිබූ බව පෙන්නුම් කරයි.

මේ අනුව බලන විට මෙම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමෙන් අයදුම්කරුවන් කීප දෙනෙක් සම්පූර්ණ ලකුණුත් බහුතරයක් වැඩි ලකුණුත් ලබාගෙන ඇත්තේ විෂය නිර්දේශයට අයත් න්‍යායාත්මක දැනුම හා විෂය සම්බන්ධ නව ප්‍රවණතා වෙන්ම අනෙකුත් ප්‍රායෝගික ආර්ථික කරුණු පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබාගෙන තිබූ නිසා බව අවධාරණය කළ යුතුය.

# B කොටස

මෙම කොටස ප්‍රශ්න 6 කින් සමන්විත වූ අතර එයින් අයදුම්කරුවන් විසින් තෝරාගත් ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සැපයිය යුතු විය.

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** (i) මානව ප්‍රාග්ධනය (Human Capital) යන සිද්ධාන්තය පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නය අයදුම්කරුවන්ගේ බහුතරයක් තෝරාගෙන තිබුණද, මෙය අඩු ලකුණු ලබා ගත් ප්‍රශ්නයක් විය. එයට හේතු වශයෙන්,

(1) මානව ප්‍රාග්ධනය ශ්‍රමය සේ සලකා නිර්වචනය කිරීම.

උදා:- යම් නිෂ්පාදන කාර්යයක් වෙනුවෙන් පුද්ගලයෙකු දරණ මානසික ආයාසය හා කායික ආයාසය ලෙස දක්වා තිබීම.

(2) මහජනයා සතු ව්‍යවහාර මුදල් මානව ප්‍රාග්ධනය ලෙස හැඳින්වීම.

(3) ශ්‍රමය නිර්වචනය කර එහි ලක්ෂණ දැක්වීම.

(ii) මානව ප්‍රාග්ධනයෙහි විශේෂ ලක්ෂණ සඳහා අයදුම්කරුවන් වැඩි දෙනෙක් ශ්‍රමයේ ලක්ෂණ ලියා තිබීම දක්නට ලැබුණි.

උදා:-

(1) පුද්ගලයාගෙන් වෙන්කොට ලබාගත නොහැකි වීම.

(2) අභිප්‍රේරණය කිරීමට පුළුවන.

(3) ප්‍රතිලාභය ලෙස වැටුප් ලැබීම.

වැනි වැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමෙන් අයදුම්කරුවන්ගේ ඒ පිළිබඳ අනවබෝධය පැහැදිලි වේ.

**(b)** ආර්ථිකයක මූලික ආර්ථික ගැටළු ඇතිවීමට හේතු විමසීමක් මෙම කොටසින් බලාපොරොත්තු වේ. බහුතරයක් අයදුම්කරුවන් මෙම ගැටළු වලට නිවැරදිව පිළිතුරු සපයා තිබුණද කරුණු වෙන් වෙන් වශයෙන් සරලව ඉදිරිපත් කිරීමක් දක්නට නොවිනි. වැඩි දෙනෙක් රචනාමය ස්වරූපයෙන් පිළිතුරු සපයා තිබුණ අතර පහත සඳහන් වැරදි හේතු ද මූලික ආර්ථික ගැටළුවලට හේතු වශයෙන් දක්වා තිබුණි.

(1) නිසි කළමනාකරණයක් නොතිබීම.

(2) රැකියා විරහිත බව (සේවා වියුක්තිය).

(3) ශ්‍රමයේ අකාර්යක්ෂමතාවන්.

මේවාට අමතරව සමහරු කුමක්, කොපමණ, කෙසේ, කා හටද යන මූලික ආර්ථික ගැටළු ලියා විස්තර කිරීමද දක්නට ලැබුණි.

**(c)** මූලික ආර්ථික ගැටළු විසඳන අර්ථක්‍රම පිළිබඳ මූලික දැනුම මැනීම මෙම කොටසින් අපේක්ෂිතයි. එය ඉතා සරල ප්‍රශ්නයක් වූ අතර බහුතරයක් ඊට අදාල ලකුණු ගැනීමට සමත් විය. එහෙත් පහත සඳහන් අඩුපාඩු දක්නට ලැබුණි:

(1) මූලික ආර්ථික ප්‍රශ්න දක්වා ඒවා දිගින් දිගටම විස්තර කිරීම.

(2) අර්ථක්‍රම හැඳින්වීම වෙනුවට,

(i) බදු විරාම හා බදු ප්‍රතිපත්ති ලිහිල් කිරීම,

(ii) වාණිජ බැංකු වලින් ණය ලබා ගැනීමෙන් මූලික ආර්ථික ගැටළු විසඳා ගත හැකි බව.

වැනි අනවශ්‍ය කරුණු ඉදිරිපත් කිරීමෙන් නියමිත ලකුණු නොලැබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** වෙළෙඳපොළ බලවේග, භාණ්ඩයක සමතුලිත මිල තීරණය කරන්නේ කෙසේදැයි ප්‍රස්තාරයක ආධාරයෙන් පැහැදිලි කිරීමේ දැනුම මැනීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සාර්ථක පිළිතුරු සපයා වැඩි ලකුණු ලබාගෙන තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් පහත දැක්වෙන අඩුපාඩු දක්වා අඩු ලකුණු ලබා ගැනීමට සමත් විය.

(1) ඉල්ලුම් හා සැපයුම් වක්‍ර මාරු කර හැඳින්වීම.

(2) සමතුලිත මිලට ඉහළ හා පහළ මිල ගණන් වලදී උඩුකුරු හා යටිකුරු තෙරපුම හඳුන්වා නොතිබීම.

(3) අධි ඉල්ලුම හා අධි සැපයුම මාරු කර දැක්වීම.

(4) උපරිම මිල හා අවම මිල පිළිබඳ සඳහන් කිරීම.

උදා:-










**(b)** ඒකාධිකාරයේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳව අවබෝධය මෙම කොටසින් විමසීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් නියමිත ලකුණු ලබා ගැනීම ප්‍රශංසනීයය. නමුත් පහත දැක්වෙන සුළු අඩුපාඩු ද දක්නට ලැබුණි.

(1) ඒකාධිකාරී තරඟයේ ලක්ෂණ ලියා දැක්වීම.

(2) සමජාතීය භාණ්ඩ නිපදවීම.

(3) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් රාශියක් වීම.

යනුවෙන් ලියා තිබීම.

**(c)** ඒකාධිකාරයකු (a monopolist) තම ලාභය උපරිම කර ගන්නේ කෙසේදැයි ප්‍රස්තාරයක ආධාරයෙන් පැහැදිලි කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වී ඇත. මෙම කොටසට නිවැරදි පිළිතුරු ලබා දී තිබුණේ අයදුම්කරුවන් සුළු පිරිසකි. පහත දැක්වෙන අඩුපාඩු දක්නට ලැබුණි.

(1) MR = MC වන ලක්ෂ්‍යයේදී ලාභය උපරිම වන බව නොදැන සිටීම.

(2) ඒකාධිකාරයේ සමතුලිතය වෙනුවට පූර්ණ තරඟයේ සමතුලිතය දැක්වීම.

(3) MR, MC, AC වක්‍ර ඡේදනය වීමෙන් සමතුලිතය ඇතිවන බව.

(4) පහත සඳහන් වැරදි ප්‍රස්තාර දක්වා තිබීම:









**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** "උපේක්ෂා වක්‍ර සිතියම" (Indifference Curve Map) යන්න පිළිබඳව න්‍යායාත්මක දැනුම අයදුම්කරුවන්ගෙන් විමසීම කර ඇත. බහුතරයක් මෙම ප්‍රශ්නය තෝරාගෙන නොතිබුණි. පිළිතුරු සැපයූ අයද අඩු ලකුණු ගැනීම දක්නට ලැබුණි. එයට හේතු වශයෙන්,

(1) උපේක්ෂා වක්‍ර ඇඳ එහි ලක්ෂණ විස්තර කිරීම.

(2) උපේක්ෂා වක්‍ර එහි ඉල්ලුම් වක්‍ර වලට සමාන කර දැක්වීම.

**(b)** උපයෝගිතා න්‍යායේ දුර්වලතා පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මැනීම මෙම කොටසින් අපේක්ෂිතය. මෙම කොටසට නියමිත ලකුණු ලබාගෙන තිබුණේ අයදුම්කරුවන් කිහිපදෙනෙක් පමණි. බොහෝ දෙනෙක් ඉතාමත් අසාර්ථක පිළිතුරු සපයා තිබුණි. එයට හේතු වශයෙන්,

(1) න්‍යායාත්මක දැනුම ඉතා අඩු මට්ටමක පැවතීම.

(2) ආන්තික උපයෝගිතා න්‍යායේ දුර්වලතා පමණක් දැක්වීම.

(3) ආන්තික උපයෝගිතාව හා මුළු උපයෝගිතාව සසඳා ලියා තිබීම.

**(c)** අත්‍යවශ්‍ය භාණ්ඩයක් සඳහා රජය බද්දක් පැනවූ විට, බද්ද පාරිභෝගිකයා සහ සැපයුම්කරු අතර බෙදී යන්නේ කෙසේදැයි ප්‍රස්තාරයක ආධාරයෙන් පැහැදිලි කිරීම මෙම කොටසින් බලාපොරොත්තු වේ. ඉතා සරල ප්‍රශ්නයක් වුවත් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

එයට හේතු වශයෙන්,

(1) බද්ද නිසා සැපයුම් වක්‍රය වමට විතැන්වීම නොදැක්වීම.

(2) බදු ප්‍රමාණය ප්‍රස්තාරය තුළින් දැක්වීම වැරදි සහගත වීම.

(3) පාරිභෝගිකයා සහ නිෂ්පාදකයා දරණ බදු ප්‍රමාණය වැරදි ලෙස ප්‍රස්තාරගත කිරීම.

උදාහරණ වශයෙන්:




**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** මෙම ප්‍රශ්නයෙන් ජාතික ගිණුම් පිළිබඳ මූලික දැනුම මැනීම අපේක්ෂිතයි. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන්ගේ වැඩි දෙනෙක් පිළිතුරු සපයා තිබුණද ඒවා සතුටුදායක නොවීය. එයට හේතු වශයෙන් පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය:

(1) සංකල්ප පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොතිබීම.

(2) මෙම ක්‍රම බදු අයකිරීමේ ක්‍රම ලෙස දක්වා තිබීම.

(3) ද්විගණන දෝෂ ඇතිවන බව දැක්වීම.

(4) එකතු වටිනාකම් පැහැදිලි කිරීමේදී තාක්ෂණික, කාර්මික සේවා යන අංශවල එකතුව ලෙස දැක්වීම.

**(b)** ජාතික ගිණුම් ගණනය කිරීම් පිළිබඳව දැනුම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂිත වුවද ඒ සඳහා සාර්ථක පිළිතුරු සපයා තිබුණේ සුළු පිරිසකි.

(1) පුද්ගලික පරිභෝජනය, රාජ්‍ය පරිභෝජනය හා දළ ආයෝජනය පමණක් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමට යොදා ගැනීම.

(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වැරදි ලෙස ගණනය කිරීම. උදා:- $\frac{29,700}{100} \times 150 = 44,550$

(3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය නිවැරදිව ගණනය කර තිබුණේ ඉතා ස්වල්ප දෙනෙක් වීම. බොහෝ අයදුම්කරුවන්,

$$\frac{29,700 - 18,000}{18,000} \times 100$$ ලෙස වැරදි ලෙස ගණනය කර තිබීම.

මෙම හේතු නිසා බොහෝ අයදුම්කරුවන්ට මෙම ප්‍රශ්නය සඳහා ලැබුණේ අඩු ලකුණු ප්‍රමාණයකි.

**(c)** ජාතික ගිණුම්වල වැදගත්කම් දැක්වෙන කරුණු පිළිබඳව ලබා දී තිබූ පිළිතුරු වැඩි ප්‍රමාණයක් අනවශ්‍ය කරුණු වලින් යුක්ත විය. එම නිසා ඉතා පහසුවෙන් ලකුණු ලබා ගැනීමට තිබූ මෙම ප්‍රශ්නයට ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබීම නිසා අඩු ලකුණු ලබා ගැනීමට සිදු විය.

උදාහරණ වශයෙන්,

(1) වැදගත්කම් සඳහා සරල බව, නැවැරදි බව, පැහැදිලි බව යනුවෙන් ලියා දැක්වීම.

(2) රටක උද්ධමනය පිළිබඳ දැන ගැනීමට හැකි යැයි දැක්වීම.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නයෙන් මුදල්, මුදල් සැපයුම හා පොලී අනුපාතිකය පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම මැනීම අපේක්ෂිත ය.

(a) මුදල් සැපයුම තීරණය කරන සාධක ලැයිස්තුගත කර ඒවා නිවැරදිව පැහැදිලි කිරීමේ හැකියාව දක්නට ලැබුණේ ඉතා ස්වල්ප දෙනෙකු තුළ පමණි. එයට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් කිරීමෙන් ඔවුන්ගේ ලකුණු ලබා ගැනීම පසුබෑමකට ලක්වී තිබුණි.

(1) පටු මුදල්, පුළුල් මුදල් සැපයුම් හඳුන්වා දීම.

(2) ද්‍රවශීලතාවරණය ගැන දක්වා තිබීම.

(3) මුදල් ඉල්ලුමේ ප්‍රධාන සාධක වන ගනුදෙනු චේතනාව, ආරක්ෂණ චේතනාව ආදිය විස්තර කිරීම.

(4) කාසි හා නෝට්ටු නිකුත් කිරීම, නිෂ්කාශන කටයුතු වැනි අනවශ්‍ය කරුණු ඉදිරිපත් කිරීම.

(b) මුදල් සැපයුම (Supply of Money) සහ සාමාන්‍ය මිල මට්ටම (General Price Level) අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීම ප්‍රශ්නයෙන් අසා තිබූ අතර මුදල් සැපයුම හා සාමාන්‍ය මිල මට්ටම පිළිබඳව අනුලෝම සම්බන්ධතාව බහුතරයක් අයදුම්කරුවන් දක්වා තිබුණි. එහෙත් මිල මට්ටම වැඩිවීමට හේතු දැක්වීමේ දුර්වල බවක් දක්නට ලැබුණි. එම නිසා මෙම කොටසටද වැඩි දෙනෙක් ලබා ගත්තේ අඩු ලකුණු ප්‍රමාණයකි.

**(c)** රටක පොලී අනුපාතය පහත වැටීමේ ප්‍රතිඵල නිවැරදිව දක්වා තිබුණේ කීප දෙනෙක් පමණි. බොහෝ දෙනෙක් බැංකුවල ඉතිරිකිරීම් සඳහා උනන්දුවක් නොදැක්වීම ලියා තිබුණේ ඉතිරිකිරීම් අඩුවීම ලෙසයි. පොලී අනුපාතය අඩුවීම නිසා විදේශ ආයෝජනය අඩුවන බව, සංවර්ධනය අඩාල වන බව වැනි අනවශ්‍ය කරුණු පිළිතුරු වශයෙන් සැපයීමෙන් අඩු ලකුණු ලැබීමට හේතු විය.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

රාජ්‍ය මූල්‍ය පිළිබඳ දැනුම මැනීම මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වේ.

(a) රාජ්‍ය අයවැය ලේඛනයේ, වර්තන ගිණුමේ අතිරික්තයෙහි වැදගත්කම දැක්වීම බහුතරයක් අයදුම්කරුවන් ඉතා සාර්ථකව කර තිබුණි.

එහෙත් සමහරු පහත සඳහන් අඩුපාඩු දැක්වීමෙන් අඩු ලකුණු ගැනීමට හේතු විය:

(1) වර්තන ගිණුම විස්තර කිරීම.
(2) අයවැය ලේඛනයේ අවස්ථා දැක්වීම.
(3) ප්‍රාග්ධන ගිණුමේ වැදගත්කම පැහැදිලි කිරීම.

(b) වර්තන සංක්‍රාම විස්තර කර කුටුම්භයට ලැබෙන සංක්‍රාම ඉතා නිවැරදිව බහුතරයක් අයදුම්කරුවන් ලියා දැක්වීම ඉතා ප්‍රශංසනීයයි. මෙම කොටසට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීම එහි ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය.

(c) (i) මෙම කොටසේ අයදුම්කරුවන්ට දී තිබූ "වර්තමානයේ ශ්‍රී ලංකා රජය යටිතල පහසුකම්වල ආයෝජනය සඳහා ප්‍රමුඛතාව දෙයි" යන ප්‍රකාශයට අයදුම්කරුවන්ගෙන් බොහෝ පිරිසක් එකඟ වන බව දක්වා තිබූ අතර එයට නියමිත සම්පූර්ණ ලකුණු ලබා ගන්නා ලදී. එහෙත් උදාහරණ සැපයීමේදී එය එතරම් සාර්ථකව ඉදිරිපත් කර නොතිබුණි. එයට හේතුව වශයෙන් එදිනෙදා ආර්ථිකයේ සිදුවන වෙනස්කම් පිළිබඳව අයදුම්කරුවන් යාවත්කාලීන නොවීම හේතු විය හැක.

(ii) එවැනි ආයෝජන සඳහා හේතු ඉදිරිපත් කිරීම බොහෝ දුරට සාර්ථකව පැවතුණි.

සමස්ථයක් වශයෙන් බලන විට මෙම ප්‍රශ්නයට වැඩි ලකුණු ලබාගෙන තිබුණි.

<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

1. සම්පූර්ණ විෂය නිර්දේශය හොඳින් අධ්‍යයනය කර තිබීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.
3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
4. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.
5. පිළිතුරු ලිවීමේදී න්‍යායාත්මක සංකල්ප විධිමත්ව ඉදිරිපත් කිරීම, අවශ්‍යතැන්හි උදාහරණ මගින් ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීම වැදගත් වේ.
6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.
9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.
10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -